Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

සියලු හිමිකම් ඇවිරිණි / All Rights reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
**Provincial Department of Education - NWP**

පළාත්

# සමාජ විද්‍යා දැනුම මිනුම තරඟය - 2019

## 10 ශ්‍රේණිය

කාලය පැය - 02 යි

නම - ........................................................................ කොට්ඨාසය - .............................................

පාසල - ........................................................................ පාසල කාණ්ඩය -

❖ ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.

❖ ප්‍රශ්න අංක 01 සිට 10 දක්වා ප්‍රශ්නවලට අදාළ නිවැරදි පිළිතුර යටින් ඉරක් අඳින්න.

1. ක්‍රි.ව. හතරවන සියවසේ දී පමණ රචනා කරන ලද දේශීය සාහිත්‍යය මූලාශ්‍රය වන්නේ මින් කුමක්ද?
   i. මහාවංශය   ii. දීපවංශය   iii. ථූපවංශය   iv. බෝධිවංශය

2. ගම්පොළ රාජ්‍ය සමයේ සිට කෝට්ටේ රාජ්‍ය කාලය දක්වා ඉතිහාසය හැදෑරීමේ වැදගත් මූලාශ්‍ර දෙක ඇතුලත් පිළිතුර තෝරන්න.
   i. නිකාය සංග්‍රහය / රාජාවලිය   iii. පැරකුම්භා සිරිත /පූජාවලිය
   ii. සීතාවක හටන / ඉංග්‍රීසි හටන   iv. ධාතුවංශය / නිකාය සංග්‍රහය

3. ප්‍රාග් ඓතිහාසික යුගයේ වැදගත් ස්ථානයක් වන පාහියන්ගල පිහිටා ඇත්තේ පහත දැක්වෙන කවර දේශගුණික කලාපය තුළද?
   i. තෙත් කලාපය තුළ   iii. පහතරට වියළි කලාපය තුළ
   ii. අර්ධ ශුෂ්ක කලාපය තුළ   iv. කඳුකර වියළි අතරමැදි කලාපය තුළ

4. පූර්ව ශිලා යුගයේ ශිලා මංජුසා සොහොන් හමු වී ඇත්තේ පහත සඳහන් කවර ස්ථානයකින්ද?
   i. බුන්දල   ii. මිනිහාගල් කන්ද   iii. ඉබ්බන්කටුව   iv. රාවණා ඇල්ල

5. ප්‍රධාන මාවත්වල "ගාවුත කණු" පිහිටු වූයේ මින් කවර රජතුමාද?
   i. ධාතුසේන රජු   ii. නිශ්ශංකමල්ල රජු   iii. i වන පරාක්‍රමබාහු රජු   iv. i වන විජයබාහු රජු

❖ ප්‍රශ්න අංක 6 සිට 10 සඳහා පිළිතුරු අතරින් වඩාත් නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න

6. දුටුගැමුණු රජුගේ පාලන කාලය ලංකා ඉතිහාසයේ වඩා වැදගත් කාල පරිච්ඡේදයක් වීමට බලපෑ ප්‍රධාන හේතුව වන්නේ මින් කුමක්ද?
   i. බුදු දහම නගා සිටුවීමට කටයුතු කිරීම
   ii. දසමහා යෝධයන්ගේ සහාය හා භික්ෂූන් වහන්සේලාගේ උපදෙස් අනුව රට පාලනය කිරීම
   iii. දීර්ඝ කාලයක් මෙරට පාලනය කළ ද්‍රවිඩ පාලකයෙකු වූ එළාර රජු පරාජය කිරීම
   iv. විධිමත් සටන් ව්‍යාපාරයක් දියත් කරමින් මුල් වරට රට එක්සේසත් කිරීම

7. පුරා වස්තු අප ඉතා හොඳින් රැකගත යුත්තේ ඇයි දැයි යන්නට වඩාත් නිවැරදි පිළිතුර වන්නේ?
   i. පුරා වස්තු අප රටේ ඉතිහාසය හැදැරිය හැකි ජීවමාන සාධක නිසාත් ඒවා අනාගත පරම්පරාවට උරුම කර දීමට අවශ්‍ය නිසාත්.
   ii. පුරා වස්තු යනු ඉතා වටිනා මිල කල නොහැකි තරම් ඒවා වීම නිසාය.
   iii. විදේශීය රටවල සංචාරකයින් පවා ඒවා දැක බලා ගැනීමට පැමිණෙන නිසා සංචාරක කර්මාන්තය දියුණු කර රටේ විදේශ විනිමය ඉහළ නැංවිය හැකි නිසාය.
   iv. අතීත මුතුන් මිත්තන් විශාල වෙහෙසක් දරා ඒවා නිර්මාණය කර ඇති නිසාය.

8. පොදුවේ ගත් විට ශ්‍රී ලංකාවේ ප්‍රාග් ඓතිහාසික යුගයෙන් පූර්ව ඓතිහාසික යුගය වෙන්කරන ප්‍රධාන සාධකය මින් කුමක්ද?
   i. ප්‍රාග් ඓතිහාසික යුගයේ මෙන් නොව පූර්ව ඓතිහාසික යුගයේ දී ගල් මෙවලම් ඉතා දියුණු මට්ටමින් නිර්මාණය කර තිබීමයි.
   ii. පූර්ව ඓතිහාසික යුගයේ මිනිසුන් මිහිදන් කිරීම සඳහා ශිලා සුසාන හා මැටි ඔරු සුසාන භාවිතා කිරීම
   iii. උඩරංචාමඩම නේවාසිකයෙන් පිංතාරු කරන ලද මැටි භාණ්ඩ හමුවීම නිසාය.
   iv. පූර්ව ඓතිහාසික යුගය ස්ථිර වාසීතාවය සහ ශාක ආහාර මත යැපෙන කාලයක් වීම.

9. රටක යහපාලනය ක්‍රියාත්මක වීමෙන් ජනතාවට ලැබෙන ප්‍රධාන යහපතක් වන්නේ මින් කුමක්ද?
   i. ජනතා ගැටලු විසඳා ගැනීමට යහපාලනය මගින් හැකිවීමයි
   ii. වංචා දූෂණ වලින් තොර සාධාරණ සමාජ පරිසරයක් තුළ ජනතාවට සාමකාමීව ජීවත් වීමට සියළු අවකාශ සැළසීමයි.
   iii. යහපත් දේශපාලඥයින් පාර්ලිමේන්තුවට යැවිය හැකි වීමයි.
   iv. ස්වාධීන අධිකරණයක් රටතුළ ක්‍රියාත්මත වීමයි

10. තිරසාර සංවර්ධනය (ධරණීය සංවර්ධනය) යන්නට වඩාත් උචිත යෙදුම මින් කුමක්ද?
   i. මිනිසුන්ගේ දරිද්‍රතාවය තුරන් වන ආකාරයේ සංවර්ධනයක් සිදුවීම තිරසාර සංවර්ධනයයි
   ii. අධිවේගී මාර්ග ඉදිකරමින් වරාය හා ගුවන් තොටුපල ඉදිකරමින් සිදුවන සංවර්ධනයයි
   iii. අනාගත පරම්පරාව සඳහා ද ස්වභාවික සම්පත් හා පරිසරය ආරක්ෂා වන අයුරින් වර්තමාන සංවර්ධන ක්‍රියාවලිය සැළසුම් කිරීමයි.
   iv. ඉතා කෙටි කාලයකින් වේගවත් සංවර්ධනයක් අපේක්ෂාවෙන් සෑම අංශයකම සිදුවන සංවර්ධනයයි.

❖ ප්‍රශ්න අංක **11** සිට **15** දක්වා ප්‍රශ්න වලට අදාළ පිළිතුර හිස්තැනෙහි ලියා දක්වන්න.

11. ලන්දේසීන් විසින් අප රටට හඳුන්වා දුන් ........................................................ නීතිය මෙරට බ්‍රිතාන්‍ය අධිකරණ පද්ධතිය තුළද ක්‍රියාත්මක විය.

12. ශ්‍රී ලංකාවට කැබිනට් ආණ්ඩු ක්‍රමයක් හඳුන්වා දුන්නේ ........................................................ ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණයෙනි.

13. කාන්තාවන්ට එරෙහි සියළුම ආකාරයේ වෙනස්කම් කිරීම් තුරන් කිරීම සඳහා පිහිටුවා ගත් සම්මුතිය ................................................ වේ.

14. ශ්‍රී ලංකාවේ මුදල් ඇමතිවරයෙකු වූ ...................................... මහතාගේ හා ඔස්ට්‍රේලියානු නියෝජිත සර් පර්සි ස්පෙන්ඩර් ගේ මූලිකත්වයෙන් කොළඹ ක්‍රමය ආරම්භ විය.

15. එක්සත් ජාතීන්ගේ අධ්‍යාපනික විද්‍යාත්මක හා සංස්කෘතික සංවිධානය හඳුන්වන ලබන කෙටි නාමය වන්නේ ............................................. යනුවෙනි.

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

16. තායිලන්තය අතීතයේදී කුමන නමකින් හඳුන්වනු ලැබුවේද?

.................................................................................

17. ක්‍රි.ව. 9 වැනි සියවසේ ජීවත්වූ අරාබි ජාතික අල් - බලසූරි ලංකාව හැඳින් වූ නම කුමක්ද?

........................................

18. කොතල කෙමියාවේ තිබෙන සෙල් ලිපියක "වසවසක සහධක" යනුවෙන් හඳුන්වා ඇත්තේ කුමක්ද?

..........................................................................................................................................

.......................

19. සාරප්ථදීපනී ,ජානකීහරණය, බාලාවබෝධය යන කෘති කවර ශිෂ්ටාචාර සමයට අයත් කෘතිද?

..........................................................................................................................................

.......................

20. පැරණි පොත්වල කරබෑඹිය නමින් හඳුන්වා ඇත්තේ මොනවාද?.......................................................................

❖ ප්‍රශ්න අංක 21 සිට 25 දක්වා දී ඇති චිත්‍ර - ඡායාරූප ඇසුරින් අසන ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

21.



i. මෙම ලෝකඩ ඇත් පහන සොයා ගනු ලැබුවේ කුමන දිස්ත්‍රික්කයෙන්ද?

.....................................................

ii. මෙම පහන ධාතු ගර්භයේ තැම්පත් කොට ඉදිකරන ලද ස්තූපය කුමක්ද?

.......................................................

22.



i. මෙම සිතියම නිර්මාණය කළේ කවුද?

.......................................................................................................

ii. මෙහි ගැන්ජීක් නදිය නමින් හඳුන්වා ඇත්තේ වර්තමානයේ කවර ගංගාවද?

................................................

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

23.



i. මෙම පින්තූරයේ දැක්වෙන ගල් පුවරුව සොයා ගෙන තිබෙන්නේ කුමන ප්‍රදේශයෙන්ද?

................................

ii. මෙම ගල් පුවරුවෙහි සඳහන් කුරුසය අයත් වන්නේ කවර කතෝලික නිකායටද?

.........................................

24.



i. මෙහි දැක්වෙන පිළිරුව කවර රජතුමාගේද?

.................................................................................................

ii. මෙම ප්‍රතිමාව දැනට ඇත්තේ අනුරාධපුරයේ කුමන ස්ථානයේද?

..................................................................

25.



i.මෙම පිංතූරයේ දැක්වෙන්නේ කවර අවස්ථාවක්ද?

.........................................................................................

ii.මෙම කාර්යයට සම්බන්ධ වන මහජනතාව සතු බලය කුමක්ද?

..........................................................................

❖ අංක 26 සිට 30 දක්වා දී ඇති ප්‍රශ්නවලට "අ" හා "ආ" යනුවෙන් තීරු දෙකක් දැක්වේ. ඒවායේ සම්බන්ධතාවය අනුව ගැලපූ විට ලැබෙන නිවැරදි පිළිතුර පහත දැක්වෙන පිළිතුරු අතරින් තෝරා යටින් ඉරක් අඳින්න.

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

26.

| අ | ආ |
|---|---|
| i. මහවැලි ගඟ | A. විලකින් ආරම්භවේ. |
| ii. නයිල් ගඟ | B. ග්ලැසියර දියවූ ජලයෙන් |
| iii. තේම්ස් ගඟ | C. කඳුකර ප්‍රදේශයක උල්පතකින් ආරම්භ වේ. |
| iv. රයින් ගඟ | D. උල්පතකින් ආරම්භ වේ |

i. A B D C   ii. D C A B   iii. C A D B   iv. C B A D

27.

| අ | ආ |
|---|---|
| i. දිග මැනීම | A. ස්වර්ණ |
| ii. අවකාශය මැනීම | B. තිපීය |
| iii. බර මැනීම | C. වියත |
| iv. කාලය මැනීම | D. අමුණු |

i. B C A D   ii. C D A B   iii. C D B A   iv. B A C D

28.

| අ | ආ |
|---|---|
| i. කූටකණ්ණ අභය රජු | A. චක්‍රවර්ති ස්වාමින් වහන්සේ |
| ii. කාශ්‍යප රජු | B. සිකමහ රජ |
| iii. නිශ්ශංකමල්ල රජු | C. ආලකමන්දාධිපති |
| iv. වළගම්භා රජු | D. නරේෂ්වර |

i.D B C A   ii.A D C B   iii.B C A D   iv.D C A B

29.

| අ | ආ |
|---|---|
| i. ඉන්දිය ද්‍රවිඩ ජනයා | A. සංක්‍රමණ |
| ii. චීන ජාතිකයන් | B. ආක්‍රමණ |
| iii. සංඝමිත්තා තෙරණිය ඇතුළු පිරිස | C. වෙළඳාම සඳහා පැමිණීම |
| iv. කාලිංමාඝ | D. ශ්‍රමිකයන් ලෙස පැමිණීම |

i. D C A B   ii. D A B C   iii. B A D C   iv. A D B C

30.

| අ | ආ |
|---|---|
| i. කුරුවේ බද්ද | A. වළං තැනීම |
| ii. රදා බද්ද | B. ඇතුන් ඇල්ලීම |
| iii. මඩිගේ බද්ද | C. රෙදි සේදීම |
| iv. බඩහැල බද්ද | D. ප්‍රවාහන කටයුතු |

i. D B A C   ii. B C D A   iii. A C B D   iv. C D A B

❖ **ප්‍රශ්න අංක 31 සිට 35 දක්වා ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.**

31. i. මැතිවරණ දිස්ත්‍රික්කයක් වූ දිගාමඩුල්ල දිස්ත්‍රික්කය පරිපාලන දිස්ත්‍රික්කයක් ලෙස හඳුන්වන්නේ කවර නමින්ද?

.............................................................................................................................................

......................

ii. (අ) පළාත් සභාවක ආණ්ඩුකාරවරයා පත්කරන්නේ කවුරුන් විසින්ද?

............................................................

(ආ) පළාත් ආණ්ඩුකාරවරයාගේ නිල කාලය වසර කීයද?

...................................................................................

**iii.** ශ්‍රී ලංකා ආණ්ඩුව සමන්විත වන ප්‍රධාන ආයතන තුන නම් කරන්න.

......................................................................................

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

.................................................................................

.................................................................................

32. i.වසභ රජතුමාගේ කාලයේ යාපනය ප්‍රදේශය පාලනය කරන ලද්දේ කවුරුන් විසින්ද?
.................................................................................

ii. a. පළමු වන විජයබාහු රජතුමා සහ ඔහුගේ දෙමාපියන්ට කුඩාකාලයේ රැකවරණය සපයන ලද රාජ්‍ය නිලධාරියා කවුද? .................................................................................

b. පළමු වන විජයබාහු රජතුමා විසින් කරන ලද ඓතිහාසික මූලාශ්‍රය නම් කරන්න.

.................................................................................

c. පැරණි ශ්‍රී ලංකාවේ රාජ්‍ය උරුමය සිදු වූ එක් ආකාරයක් උදාහරණයක් සහිතව දක්වන්න.

.................................................................................

33. i. “BW” යන සංකේතයෙන් හඳුන්වන ලංකාවේ වී පර්යේෂණ ආයතනය කුමක්ද?
.................................................................................

ii. ශ්‍රී ලංකාවේ තේ වගා කරන ප්‍රදේශ ප්‍රධාන වශයෙන් කොටස් 3 කි. ඉන් “මැදරට තේ” වගාකරන දිස්ත්‍රික්ක 2 ක් නම් කරන්න.

...................................................................

...................................................................

iii. සුළු පොල් ත්‍රිකෝණය නම් කරන්න
............................................ ............................................
............................................

34. i. සංස්කෘත භාෂාවෙන් තරමක විශාල කුඹුරු යායවල් හැඳින්වූයේ කුමන නමින්ද?
.................................................................................................................

ii. තෝනිගල සෙල්ලිපියේ සඳහන් වන පරිදි වී වගා කරන කන්න දෙකක නම් ලියන්න

.................................................................................................................

iii. පැරණි හේනක් ආරක්ෂා කිරීමට ගත් ක්‍රියාමාර්ග 3 ක් නම් කරන්න.

.................................................................................................................

.................................................................................................................

.................................................................................................................

35. i. මහවැව් තැනීම ආරම්භ කළ පාලකයා කවිද?
.......................................................................................

ii. වැවක ප්‍රධාන අංග 3 ක් නම් කරන්න. .........................................................

......................................................... .........................................................

iii. ඉන් එකක නිර්මාණය හා කාර්යයන් පිළිබඳ කරුණු 3ක් සඳහන් කරන්න.

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

.......................................................................................................................................

.......................................................................................................................................

.......................................................................................................................................

...................................................................

.......................................................................................................................................

..............

.......................................................................................................................................

.......................................................................................................................................

.......................................................................................................................................

............................................................

**ප්‍රශ්න අංක 36 සිට ප්‍රශ්න අංක 45 දක්වා දී ඇති ස්ථාන සපයා ඇති ලංකා සිතියමේ ලකුණු කර නම් කරන්න.**

36. කලා ඔය
37. හුරුළු වැව
38. කොළඹ
39. දඹකොල පටුන
40. දෙවුන්දර තුඩුව
41. දේවනගර
42. පරාක්‍රම සමුද්‍රය
43. ගම්පෙොල
44. කිරිදි ඔය
45. පරාක්‍රම සමුද්‍රය

**ශ්‍රේණිය - පළාත් මට්ටම**

**ප්‍රශ්න අංක 36 සිට ප්‍රශ්න අංක 45 දක්වා දී ඇති ස්ථාන ලකුණු කිරීමට පහත සපයා ඇති ලංකා සිතියම යොදා ගන්න.**

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

